**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

කුසලතා කැප්ස්ටෝනය - ජූලි 2019

## (SS2) තොරතුරු තාක්ෂණ කුසලතා

(Information Technology Skills)

---

**මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රධාන අරමුණ වන්නේ තොරතුරු තාක්ෂණ කුසලතා පිළිබඳව අයදුම්කරුවන්ගේ සමස්ත දැනුම, කාර්යාල යෙදවුම් මෘදුකාංග කෙරෙහි වැඩි සැලකිල්ල ඇතිව කාර්යාල පරිසරය තුළ යෙදවීම පරීක්ෂා කිරීමය. මෙම ප්‍රශ්න පත්‍රයට සාර්ථකව මුහුණ දී උත්තර ලිවීමට, කාර්යාල පරිසරයක තොරතුරු තාක්ෂණය යෙදවීම පිළිබඳ ප්‍රායෝගික දැනුම ඉතා වැදගත් බව සැලකිය යුතුය.**

---

## A කොටස

අනිවාර්ය ප්‍රශ්න විස්සකි (20)

(මුළු ලකුණු 40)

### ප්‍රශ්න අංක 01

තොරතුරු තාක්ෂණ කුසලතා පිළිබඳ න්‍යායාත්මක දැනුම සහ ප්‍රායෝගික දැනුම යන සමස්ත පැතිකඩ කෙරෙහි කේන්ද්‍රගත වෙමින් එයට අදාල දැනුම විස්තීර්ණ අන්දමින් මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. අයදුම්කරුවන් බොහෝ දෙනෙකුට ප්‍රශ්නයට වෙන්කළ ලකුණු 40 න් අඩකට වඩා උපයා ගැනීමට හැකිවිය. එහෙත්, මෙම කොටසට ලකුණු 30 කට වඩා ලබාගෙන තිබුණේ ටික දෙනෙකු පමණි. ව්‍යවසාය සම්පත් සැලසුම් කිරීම (ERP) වැනි ක්ෂෙත්‍ර කෙරෙහි අයදුම්කරුවන් වැඩි අවධානයක් යොමු කළ යුතුය. තවද MS Word සහ MS PowerPoint වලට අදාල ප්‍රශ්නවලට අයදුම්කරුවන් දුර්වල අන්දමට උත්තර ලියා තිබුණේය. මෙම ප්‍රශ්නයට උපරිම ලකුණු ලබා ගැනීම විභාගය සමර්ථ වීම සඳහා ස්ථිර වශයෙන්ම ඔවුනට උපකාරී වනු ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

අනිවාර්ය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 60)

### ප්‍රශ්න අංක 02

දත්ත පදනම් කළමනාකරණ පද්ධති පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම කෙරෙහි මෙම ප්‍රශ්නය ඉලක්කගත විය. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය.

ඔවුන් අතුරෙන් බහුතරයට, දැනට භාවිතයට ගැනෙන වෙනත් දත්ත පදනම් 4 ක් ලැයිස්තුගත කිරීම ගැන වූ **(a) කොටසට** නිවැරදි ලෙස උත්තර ලිවීමට හැකිවිය. **(b) කොටස** නූතන දත්ත පදනම් කළමනාකරණ පද්ධතිවල ලක්ෂණ ගැන වූ අතර, **(c) කොටස** දත්ත පදනම් කළමනාකරණ පද්ධති භාවිතයේදී වියහැකි සීමාවන් හා ගැටළු පිළිබඳව විය. **(d) කොටස** OLE object දත්ත වර්ගය ගැන විය. බහුතරයක් අයදුම්කරුවන් **(c)** හා **(d) කොටස්වලින්** අපේක්ෂා කළ උත්තර ලබා දී තිබුණේ නැත. අයදුම්කරුවන් සියලු දෙනාටම OLE Object දත්ත වර්ගය සහ එහි අරමුණු පිළිබඳව අදහසක් තිබුණේ නැත. දත්ත පදනම් කළමනාකරණ පද්ධති පිළිබඳව ඉගෙනීමට අත්‍යවශ්‍ය කාරණයක් වූ ප්‍රායෝගික අත්දැකීම්වලට යොමුවන ලෙස අයදුම්කරුවන්ට නිර්දේශ කරනු ලැබේ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නයෙන් පැතුරුම්පත් යෙදවීම පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර තිබේ. අවශ්‍ය ගණනය කිරීම් ලබාගැනීම සඳහා යෝග්‍ය ශ්‍රිතය හඳුනාගැනීම හා නිවැරදි සූත්‍රය ලිවීමද මෙහිදී කළ යුතු විය. සීමිත අයදුම්කරුවන් පිරිසක් මෙයට උත්තර ලියා තිබුණේය. ලකුණු 12 න් ලකුණු 3 සිට 6 දක්වා ලබාගැනීමට හැකිවූයේ ඉතාමත් සුළු අයදුම්කරුවන් පිරිසකට පමණි. මයික්‍රොසොෆ්ට් එක්සෙල් පිළිබඳව ප්‍රායෝගික අත්දැකීම් අයදුම්කරුවන් බහුතරයකට නොමැතිවීම නිසා **(a), (b), (c)** සහ **(d) කොටස්** සඳහා සූත්‍රවල දෝෂ රාශියක් තිබුණේය.

කෙසේවෙතත්, **(e) කොටස** සඳහා මයික්‍රොසොෆ්ට් වින්ඩෝස් පාදක මෙහෙයුම් පද්ධති මත මයික්‍රොසොෆ්ට් එක්සෙල් පැතුරුම්පත් පැකේජ විකල්ප ලෙස යොදාගත හැකි බව සඳහන් කරමින් සම්පූර්ණ ලකුණු ලබාගත් අයදුම්කරුවන් සැහෙන සංඛ්‍යාවක් සිටියහ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 04

කාර්යාලයීය පරිසරයක් තුළ විද්‍යුත් තැපැල් සන්නිවේදනය භාවිත කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම කෙරෙහි මෙම ප්‍රශ්නය කේන්ද්‍රගත වී ඇත. විකල්ප ප්‍රශ්න අතුරෙන් වඩාත්ම මනාපයක් දක්වා තිබූ ප්‍රශ්නය මෙය විය. අයදුම්කරුවන් සියලු දෙනාම පාහේ මෙම ප්‍රශ්නය තෝරාගෙන තිබූ අතර, සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණේය.

එහෙත් **(h) කොටස** සඳහා, අයදුම්කරුවන්ගේ සමහර දෙනෙකුට PDF ගොනු සඳහන් කිරීමට නොහැකි විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නයෙන් අන්තර්ජාලය සහ අන්තර්ජාලය සම්බන්ධිත බැංකුකරණයට අදාල අයදුම්කරුවන්ගේ දැනුවත්භාවය පරීක්ෂා කිරීම අපේක්ෂා කර ඇත. අයදුම්කරුවන් සියලුදෙනාම වාගේ මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි.

**(a) කොටස** සම්බන්ධයෙන් අන්තර්ජාලය සහ ලෝක ව්‍යාප්ත වෙබ් අඩවිය (World Wide Web) අතර වෙනස බොහෝ අයදුම්කරුවන් පැහැදිලි කර තිබුණේය.

එහෙත් ඉතිරි උපකොටස් සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය අපේක්ෂිත මට්ටමට තිබුණේ නැත. අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය ගණනකට ෆිෂින් අඩවිය (phishing site), බිට්කොයින් (Bitcoin) සහ වෙබ් ඩොමේන් (website domain) පිළිබඳ අදහසක් නොතිබුණි.

ප්‍රශ්නයේ මෙම කොටස්වලට අදාල නැති දීර්ඝ උත්තර ඔවුන් ලියා තිබුණේය. ෆිෂින් අඩවිය, බිට්කොයින්, ආදී නූතන පද පිළිබඳව වැටහීමක් ඔවුන්ට තිබිය යුතුය. අයදුම්කරුවන්ට වැඩිපුර ලකුණු ලබාගත හැක්කේ එවිටය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

පද සැකසීමේ නිපුණතාව පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙම ප්‍රශ්නයෙන් සිදුකර තිබේ. දෙන ලද අංග මගින් ඉටු කරනු ලබන කාර්යයන් පැහැදිලි කිරීම අවශ්‍ය කර ඇත. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. ප්‍රශ්නයේ **(a) කොටසේ (ii), (III), (iv)** සහ **(vi)**, එනම් Word Art, paste text, comments සහ watermark යන අංගවලට, යෝග්‍ය උත්තර ලිවීමට ඔවුන් අතුරෙන් බොහෝ දෙනෙකුට හැකිවී ඇත. නමුත් අනෙකුත් උප කොටස්වලට ලියූ උත්තර සතුටුදායක නැත.

ප්‍රශ්නයේ **(a) කොටසේ (i)** සහ **(v)** සඳහා අයදුම්කරුවන් බොහොමයක් නිවැරදිව ඒවාට යොමුවීමක් වී නොමැති බව සටහන් කළ යුතුය. ප්‍රශ්නයේ **(b) කොටස** සඳහා අයදුම්කරුවන් බහුතරයක් කිසියේත් උත්තර ලිවීමක් නොකර තිබුණේය. දී තිබූ ප්‍රකාශනය සමග එකඟවන බව දැක්වූ අයදුම්කරුවන්ටද ඔවුන්ගේ උත්තර සාධාරණීකරණය කිරීමට හැකි වී නැත.

ඉහළ ලකුණු ලබාගැනීම සඳහා පද සකසනයෙහි ප්‍රායෝගික භාවිතය තිබිය යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 07

පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂාවට ලක්කළ ප්‍රශ්නයකි. දෙන ලද අංගයන්ගෙන් ඉටුකෙරෙන කාර්යයන් දැක්වෙන කෙටි සටහන් ලිවීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කරන ලදී. සීමිත අයදුම්කරුවන් ගණනක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. සාමාන්‍ය ලකුණු ප්‍රමාණයක් ලබාගත හැකි වූයේ අයදුම්කරුවන් ස්වල්ප දෙනෙකුට පමණි. ප්‍රශ්නයේ **(a) කොටස** සඳහා වෙන්කර තිබූ මුළු ලකුණු 12 න් අඩක්වත් ලබා ගැනීමට සියලුම අයදුම්කරුවන්ට හැකියාවක් නොතිබුණි.

සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයේ **(a) කොටසේ** උප කොටස් **(iv)** සහ **(v)** සඳහා එම අංගවල නම් ආශ්‍රිතව තේරුම අනුමාන කර උත්තර ලිවීම කර තිබුණි.

**(b) කොටස** මගින් පවර්පොයින්ට් මෘදුකාංග නොමැති මේසය මත තබන පරිගණකයක් තිබෙන සේවාදායකයෙකුගේ සේවා ස්ථානයක පවර්පොයින්ට් ඉදිරිපත් කිරීමේ ක්‍රමය පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබුණි. නමුත් බහුතරයක් අයදුම්කරුවන් ඒ සඳහා නිවැරදි ක්‍රමය හඳුනාගෙන නොතිබුණි.

සමහර අයදුම්කරුවන් සේවාදායකයාගේ පරිගණකයේ පවර්පොයින්ට් ස්ථාපනය කර ඉදිරිපත් කිරීම කළ හැකියැයිද උපකල්පනය කර තිබුණි. ප්‍රශ්නයේ දී තිබෙන තොරතුරුවලට පරිබාහිරව උපකල්පන සිදුකළ නොහැකි බව අයදුම්කරුවන් සැළකිල්ලට ගත යුතුය.

පවර්පොයින්ට් ඉදිරිපත් කිරීම් පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ආශ්‍රිතව නිපුණතාවය වර්ධනය කළ හැකිවනු ඇත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැළකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.
2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත සෘජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකිරීම.
3. මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.
4. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කිරීම.
5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.
6. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කර ගැනීම.
7. කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එනම්, එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂිත කාලයට වඩා වැඩි කාලයක් ගත නොකිරීම.
8. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.
9. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -